## ප්‍රස්තාවනාව

"කෘෂි ඵලදායිතා වෘද්ධිය හා ඵලදායිතා විචලනය: හම්බන්තොට දිස්ත්‍රික්කයේ වී ගොවිතැන පිළිබඳ අධ්‍යයනයක්" නම් වූ මෙම පර්යේෂණ නිබන්ධය රුහුණු විශ්ව -විද්‍යාලයේ දර්ශනපති උපාධි පරීක්‍ෂණය සඳහා ඉදිරිපත් කරන්නකි. මෙම නිබන්ධයෙහි ප්‍රධාන විෂය 1960 - 84 කාලපරිච්ඡේදය තුළ හම්බන්තොට දිස්ත්‍රික්කයේ වී ගොවිතැනෙ -හි ඵලදායිතා වෘද්ධිය සහ ඵලදායිතා විචලනය පිළිබඳ ව හැදෑරීම වුව ද, එම අධ්‍යයනයට පසුබිම් වශයෙන් ශ්‍රී ලංකාවේ වී වගාවේ උපනතී, ගැටලු හා ප්‍රතිපත්ති පිළිබඳ ව ද පොදුවේ විමර්ශනයක් කරන ලදි.

ශ්‍රී ලංකාවේ භෝග වගා අංශය තුළ වී ගොවිතැනෙහි දායකත්වය අතිවිශාල ය. වී නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා යොදා ගනු ලැබ ඇති ප්‍රයත්න ආදායම, සේවා නියුක්තිය, ගෙවුම් ශේෂය සහ ආදායම් ව්‍යාප්තිය යන අංශ කෙරෙහි දක්වනු ලබන බල පෑම සුළු පටු නො වේ. වී නිෂ්පාදනය ඉහළ නැංවීමේ කාර්යයේ දී වඩා ඉක්මන් වූත්, සරල වූත් උපාය මාර්ගය වනුයේ භූමි ඵලදායිතාව වැඩි කර ගැනීම යි. කෘෂි -කාර්මික ඵලදායිතාව වැඩි කිරීම ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයේ ප්‍රධාන අරමුණක් වුවත් බොහෝ අධ්‍යයන තුළ එම ක්‍ෂෙත්‍රයේ වැදගත්කම නො සලකා හැර තිබේ. බොහෝ විට ප්‍රධාන භෝග කිපයක ඵලදායිතාව පිළිබඳ නියැදි දත්ත විශ්ලේෂණය කර තිබුණත්, ඵලදායිතා වෘද්ධිය හා ඵලදායිතා විචලනයට අදාළ, ඵලදායිතා මිනුම් සහ විශ්ලේෂණ සම්බන්ධයෙන් අඩු අවධානයක් යොමු වී ඇත. මේ හැර ශ්‍රී ලංකාවේ කෘෂි අංශයේ දත්ත පදනම තවමත් අසංවර්ධිත මට්ටමක පවතින අතර වී වගා අංශයට අදාළ ව එක් රැස් කොට ඇති දත්ත ඵලදායිතා වෘද්ධි හා විචලන පිළිබඳ ගැඹුරු විශ්ලේෂණයකට හෝ අර්ථ නිරූපණයකට හෝ අනුමිතියකට හෝ ප්‍රමාණවත් නො වේ. විශේෂයෙන් කාලශ්‍රේණි පදනමක් මත ඵලදායිතා විශ්ලේෂණය කිරීමේ දී මෙම ගැටලුව තවත් උග්‍ර වේ. ප්‍රාදේශීය හෝ දිස්ත්‍රික්ක හෝ කලාපීය හෝ වශයෙන් ඵලදායිතා වෘද්ධි හා විචලනය පිළිබඳ විශ් -ලේෂණයේ දී මෙම අඩුපාඩුව තද බල ලෙස කැපී පෙනේ.

මෙම අධ්‍යයනයේ දී වැඩි අවධානයක් යොමු කළේ සාර්ව දත්ත පදනමක් මත කෘෂි ඵලදායිතා වෘද්ධිය සහ ඵලදායිතා විචලතය විශ්ලේෂණය කිරීම කෙරෙහි වුව ද, දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය මට්ටමින් ඵලදායිතා දත්ත සංගෘහිත වී නො මැති නිසා ප්‍රාදේශීය ඵලදායිතා විචලතය මිනුම් කිරීමේ දී අදාළ දත්ත ලබා ගැනීම සඳහා ක්ෂේත්‍ර සමීක්ෂණයක් කිරීමට ද සිදු විය. මේ සඳහා හම්බන්තොට දිස්ත්‍රික්කයේ විශාල වාරිමාර්ග, සුළු වාරිමාර්ග සහ වර්ෂාපෝෂිත ප්‍රදේශ නියෝජනය වන පරිදි වගා නිලධාරි කොට්ඨාස 03ක් තෝරා ගත් අතර නියැදියක් වශයෙන් එක් එක් කොට්ඨාසයේ ගොවි පවුල්වලින් සියයට 20 බැගින් තෝරා ගන්නා ලදි. නියැදිය මෙසේ තෝරා ගැනීමට සිදු වූයේ හුදෙක් විවිධ ජල සැපයුම් මූලාශ්‍ර පදනම් යටතේ වී ඵලදායිතා විචලතය විමර්ශනය කිරීම සඳහා ය.

ශ්‍රී ලංකාවේ වී වගා අංශයට අදාළ ඵලදායිතා මිනුම් සහ විශ්ලේෂණ සම්බන්ධ අධ්‍යයන සීමිත බැවින්, වී ඵලදායිතාවේ වෘද්ධිය හා විචලතය සම්බන්ධ ව හම්බන්තොට දිස්ත්‍රික්කය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් සිදු කළ මෙම අධ්‍යයනය, ඵලදායිතා මිනුම් සහ ඵලදායිතා විචලතය සම්බන්ධයෙන් මුළු දිවයින ආශ්‍රිත ව කරනු ලබන ගැඹුරු විශ්ලේෂණ සඳහා පදනමක් සැපයෙනු ඇත.

කිසි දු අධ්‍යයන නිවාඩුවකින් තොර ව ඉතා අවිවේකී පරිසරයක් තුළ පශ්චාත් උපාධි පර්යේෂණ කාර්යයෙහි නියැලී සිටි මට එහි දී මුහුණ පෑමට සිදු වූ විවිධ න්‍යායාත්මක හා ප්‍රත්‍යක්ෂමූල ගැටලු හඳුනා ගැනීමටත් ඒවා නිරාකරණය කර ගැනීමටත් අවශ්‍ය උපදෙස් නිරතුරු ව ම ලබා දෙමින්, පර්යේෂණ කාර්යය සඳහා අවශ්‍ය අධ්‍යයන පරිසරයට හැම විටම මා යොමු කර වූ රුහුණ විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ පීඨාධිපති, ආර්ථික විද්‍යාව පිළිබඳ මහාචාර්ය ඩැනී අතපත්තු මහතා මෙහි දී ස්තූති පූර්වකව සිහිපත් කරමි. මෙම පර්යේෂණයේ දී විෂයානුගත හා පර්යේෂණාත්මක ගැටලුවලින් මංමුළා වූ සෑම විටක ම නිසි මාවතට මා යොමු කරවමින් එතුමාගේ කාලයත්, ශ්‍රමයත් කැප කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් මෙම නිබන්ධය නිම කිරීමට හැකි වූ බව මෙහි දී නිහතමානී ව සඳහන් කළ යුතු ව ඇත.

පර්යේෂණ කටයුතුවල දී පර්යේෂණාත්මක ප්‍රගතිය සොයා බලමින් මාගේ සෛද්ධාන්තික දැනුම ප්‍රගුණ කිරීමට මහඟු උපදේශකත්වයක් සැපයූ කොළඹ විශ්වවිද්‍යාල -යේ ආර්ථික විද්‍යාව පිළිබඳ මහාචාර්ය ඩබ්ලිව් ඩී. ලක්ෂ්මන් මහතා ද මෙම කාර්යයේ දී හැම විට ම මා දිරි ගැන් වූ කොළඹ විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පියදාස සේනානායක මහතා ද මෙම පර්යේෂණ ගැටලුව කෙරෙහි මා යොමු කළ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ආචාර්ය පියසිරි වික්‍රමසේකර මහතා ද මෙහි දී කෘතඥතා පූර්වක ව සිහිපත් කෙරේ.

ක්ෂේත්‍ර සමීක්ෂණයේ දී සහයෝගය ලබා දුන්, උඩ බැරගම, ගොඩවෙල හා වීරකැටිය වගා නිලධාරි මහතුන්ටත්, හම්බන්තොට දිසාපති කාර්යාලයෙහි සංඛ්‍යා ලේඛන අංශය, ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය ඇතුළු තොරතුරු සපයා දුන් විවිධ ආයතනවල නිලධාරි මහත්ම මහත්මීන්ටත්, මෙම නිබන්ධයේ දිනත් අයුරින් උදව් කළ රුහුණ විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයන අංශ ප්‍රධාන පී.බී.ඒකනායක මහතාටත්, පී.එම්.දයානන්ද, එස්.කේ.ධර්විත්, ඩී.පී.වික්‍රමසිංහ, ප්‍රේමදාස ලියනාරච්චි,සෙනරත්, බණ්ඩාර හේරත් යන හිතවතුන්ටත් නිබන්ධය යතුරු ලියන කළ මල්කාන්ති මුතුකුමාරණ හා ඥානා වෙදගේ යන මහත්මීන්ටත්, කෘතඥතා ස්තූතිය පිරි නමමි.